සැ. යු. — මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

2011.10.14 දින පළ වූ අංක 1,728 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,729 - 2011 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2011.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1640 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) රංජිත් අලුවිහාරේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 අගෝස්තු මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සිත් සෙවන මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මිනුවන්ගොඩ සිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ඔක්තෝබර් මස 28 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1639 - B 80370— 7,100 (2011/10)
F1-(S/E)

# පළාත් සභා නිවේදන

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම, නිවාස සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබාදීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2011.12.15 යන දින පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.-

| | | | |
|---|---|---|---|
| (අ) | ඉඩමේ නම | : | මැදගම මූකලාන |
| (ආ) | ඉඩමේ මැනුම් විස්තර | : | හු. මු. පි. 13 හි කැබලි අංක 544 න් කොටසක් |
| (ඇ) | ඉඩම් පිහිටි ගම | : | මැදගම |
| (ඈ) | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | අංක 87 මැදගම |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | ගල්ගමුව |
| (ඊ) | දිස්ත්‍රික්කය | : | කුරුණෑගල |
| (උ) | අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය | : | ගොඩ ඉඩම |
| (ඌ) | අන්සතු කරනු ලබන ඒකකය | : | හු. මු. පි. 13 හි කැබලි අංක 544 න් කොටසක් |

02. ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචි පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.-

1. ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවකයින්,
2. ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධිත වූවන්,
3. ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් වූවන්ගේ

   (අ) විවාහක නම් කලත්‍රයා හෝ අවිවාහක දරුවන්
   (ආ) අවිවාහක නම් මව හෝ පියා

3. ඉඩම් ඉල්ලුම්කරුවන් සතුව වෙනත් ඉඩම් නොතිබිය යුතුයි.

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2011.11.15 දින හෝ ඊට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව'' වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුයි.

04. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2011.12.15 වැනි දින පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතුයි. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුයි.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුයි.

06. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසි වලට යටත් වනු ඇත.

07. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද ඒ ඉඩම වෙනුවෙන් අක්කරයකට රු. 40,000 බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුනු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇත.

01. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
02. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.

පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2011 සැප්තැම්බර් මස 28 වැනි දින,

ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත :-

*රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම නිවාස සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබාදීමට ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් ගල්ගමුව, ගිරිබාව, ඇහැටුවැව, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය*

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.

   (අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   (ආ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස : (අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක ද යන වග :————.
9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.
11. අයදුම්කරු/කලත්‍රයා (පුරුෂයා හා භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම (රුපියල්)* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

12. ඉල්ලුම්කරු හා යැපෙන්නන් සතු ඉඩම් වල විස්තර :

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| | | | |
| | | | |

(නිවාස හා දේපල උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය.)

13. කලත්‍රයා (පුරුෂයා/භාර්යාව) රජයේ සේවකයකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න. :————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය : තමාගේ ද ? බද්දට ද ? කුලියට ද ? අනවසරයෙන් ද ? යන වග :————.
15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

10-395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.